# භගත් සින් - ''මා අදේවවාදියෙකු වූයේ මන්ද''



**උපත : 1907 සැප්තැම්බර් 28**
**ජරන්වාලා තෙසිල්, පන්ජාබ්, බ්‍රිතාන්‍ය ඉන්දියාව**

**මරණයඃ 1931 මාර්තු 23 (වයස අවුරුදු 23 දී)**
**ලාහෝර්, පන්ජාබ්, බ්‍රිතාන්‍ය ඉන්දියාව**

භගත් සින් යනු ඉන්දියානු නිදහස් ව්‍යාපාරය වෙනුවෙන් සිය ජීවිතය කැප කළ එක් සුන්දර, තිරසර මිනිසෙකි. දැඩි ලෙස දේවවාදී මතයන්ට, පාරභෞතිකවාදයට විරුද්ධ වූ ඉන්දියාවේ එකළ නැගුණු විප්ලවවාදී පරපුර ඔහු නියෝජනය කරයි.

ගාන්ධි වැනි දේශීය ධනේශ්වරයේ ඒජන්තවරු ඊනියා සාමකාමී ව්‍යාපාර, සත්‍යග්‍රහ හඳුන්වා දෙමින් ඉන්දීය නිදහස් අරගලය ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ට එරෙහි සටන්කාමී නොවන ස්ථාවරයක පවත්වාගෙන යෑමට වග බලා ගත්හ. එවැනි සමහර සත්‍යග්‍රහ අරගල පොලිස් නිළධාරීන් කිහිප දෙනෙකු වෙඩි තැබීම මගින් පමණක් විසුරුවා හැරීම අසිරු නොවීය. භගත් සින් විසින් ඊට ප්‍රතිපක්ෂව සටන්කාමී ලෙස අධිරාජ්‍යවාදයට එරෙහිව අරගල කිරීම වඩා ඵලදායී බව ඉස්මතු කරමින් ඉන්දියාව පුරා විප්ලවීය ව්‍යාපාරය ඇවිළවීමට තමන්ගේ සගයින් සමග ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කළහ. පසුව ඉංග්‍රීසීන්ගේ අත් අඩංගුවට පත් වූ ඔහු එල්ලා මරා දමන ලදි. එවිට ඔහුගේ වයස 23ක් විය. ''මා අදේවවාදියෙකු වූයේ මන්ද'' යන ශ්‍රේෂ්ඨ ලිපිය ඔහු විසින් රචනා කරන ලද්දේ මරණ දණ්ඩනය නියමව සිරගතව සිටියදීය.

එසේ ඇරඹුණු ඉන්දියාවේ විප්වවාදී ව්‍යාපාරයේ නොනිමි ගමන අද දක්වාම එහි සටන්කාමී භූමි භාග සිසාරා පැතිර යයි... ඉන්දියාවේ කදිම දූ පුතුන්, නැක්සලයිවරු (මාඕවාදීන්) ලෙස හඳුන්වන ඔවුහු ශ්‍රේෂ්ඨ නිර්ධන පංති ජාත්‍යන්තවාදයේ ජීව ගුණයෙන් නව ලොවක් පිබිදවීම උදෙසා සටන් වදියි... ඒ

අභිත අරගලය ලොව පුරා සියළු ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ, විප්ලවවාදීන්ගේ සහ කොමියුනිස්ට්වාදීන්ගේ අරගලය ද වන්නාහ...

ඔහු විසින් ලියූ ''මා අදේවවාදියෙකු වූයේ මන්ද'' කෘතිය ඉදිරියේදී මාඕවාදී විප්ලවීය ලීගය විසින් මෙහි පළ කිරීමට කටයුතු කරයි...

## මේ එයින් උපුටාගත් පාඨ කිහිපයකි...

''ඔබේ ඇස් ඇර බලන්න හිර ගෙවල්වල භයානක ඇඳිරි කාමරවලට වඩා අපිරිසිදු මුඩුක්කුවල සහ පැල්පත්වල මිලියන ගනන් මිනිසුන් හාමතින්...''

''ධනවත් ජාතීන් සිය අතිරික්ත නිෂ්පාදනය දුප්පත් සහ කිසිවක් නැති අය අතර බෙදා දෙනවා වෙනුවට මුහුදට විසි කරන අයුරු බලන්න. මිනිස් ඇටකටු මත ඉදිකරන ලද රජවරුන්ගේ මාළිගා තිබේ...''

''දෙවියන් සම්භවය (බිහි වීම) වීම සම්බන්ධයෙන් ගත් කල , මිනිසා සිය දුබලකම්, සීමාවන් සහ අඩුලුහුඬුකම් අවබෝධ කරගත් විට සිය මනඃකල්පනය තුළ දෙවියන් නිර්මිත කළේය යන්න මගේ සිතුවිල්ල වේ. මේ ආකාරයෙන් ඔහු තැත් කරන ලද සියළු ම කාරණාවන්ට මුහුණ දීමට සහ සිය ජීවිතය තුළ වෙසෙසින් හටගන්නා සියළු අන්තරායන්ට මුහුණ පෑමට මෙන්ම සමෘද්ධිමත් සහ පොහොසත් බවේදී සිය කලහකාරීත්වය මැඩ පැවැත්වීමට ඔහු ධෛර්ය ලබා ගත්හ. දෙවියන්ව, මනස් පරිකල්පනය තුළ වෛවර්ණ ආකරයෙන් සර්වබලධාරී හැකියාවන් සහ ස්නේහවන්ත උදූරත්වය සමග පින්තාරු කරන ලදි. මිනිසා සමාජයට අනතුරුදායක නොවන්නකු සේ වග බලා ගැනීමට වරින් වර දෙවියන්ගේ කෝපය සහ ඔහුගේ නීති ප්‍රචාරණය කරමින් ඔහුව පලිගැනීමේ සාධකයක් ලෙස භාවිතා කරන ලදි. පීඩිත ආත්මයේ වැළපීම බවට ඔහු පත් කරනු ලදුව මිනිසා හුදෙකලාබවට සහ අසරණ බවට පත්වන පීඩාකාරී වෙලාවේදී නැගිට සිටුවීමට සිටින මවෙක් සහ පියෙක්, සොහොයුරියක් සහ සොහොයුරෙක්, සොහොයුරෙක් හෝ මිතුරෙක් ලෙස විශ්වාස කරනු ලැබූහ. ඔහු සර්වබලධාරී වූ අතර ඕනෑම දෙයක් කළ හැකි විය. පීඩාවෙන් සිටින මොහොතේදී දෙවියන් පිළිබඳ අදහස මිනිසාට ප්‍රයෝජනවත් විය.''

''සමාජය ප්‍රතිමාවලට වැඳීම සහ අනෙකුත් පටු ආගමික සංකල්පයන්ට එරෙහිව සටන් කලා මෙන්ම දෙවියන් ගැන වූ මේ විශ්වාසයට එරෙහිව සටන් කළ යුතුය. මේ ආකාරයට මිනිසා ඔහුගේ දෙපතුලින් සිට ගැන්මට උත්සහ කළ යුතුය. යථා තත්වය දකිමින්, ඔහුට ඔහුගේ ඇදහිලි පසෙකට විසි කර දමා සියළු එදිරිවාදිකම්වලට ධෛර්යයෙන් යුතුව සහ නිර්භීතව මුහුණ දීමට සිදුවනු ඇත. මෙය නිසැක ලෙසම මගේ මනසෙහි තිබෙන ස්ථාවරයයි. මගේ මිතුරනි, එය අහංකාරයක් නොවේ; එය මාව අදේවවාදියෙකු කළ මගේ සිතීමේ ආකාරය වෙයි. දෙවියන් ගැන මගේ විශ්වාසය බලවත් කරමින් දිනපතාම ඔහුට යාඥා කිරීමට මම කල්පනා නොකරමි, (මෙය මිනිසා තුළ වූ ඉතාම අධම අංගයක් ලෙස

මම සලකමි. ) මගේ තත්වය තුළ වැඩි දියුණුවක් ඇති කිරීමට මට හැකිය, එසේ නැතිව එය තවදුරටත් පහතට දැමීම නොවේ. බොහෝ අදේවවාදීන් කරදර වලට අභීත ලෙස මුහුණ දුන් බව මම කියවා ඇත්තෙමි, එබැවින් පෝරකය මත දී වුව; මම අවසානය දක්වාම හිස ඔසවාගෙන කෙලින් තබාගෙන මිනිසෙකු ලෙස නැගී සිටීමට උත්සාහ කරමි.''

''මගේ අචල බව කෙතරම් ද බලන්න. මගේ මිතුරකු මට යාඥා කරන්නැයි කීහ. මා අදේවවාදියෙකු බව දැනුම් දුන් විට, ඔහු මෙසේ කීය, ''ඔබේ අවසන් දවස් එළඹුණු පසු, ඔබ විශ්වාස කරන්නට පටන් ගනීවි.'' මම කීවෙමි, ''නැත, ආදරණීය මහත්මයා, එය කවදාවත් සිදු නොවේ. මම එය නින්දා සහගත සහ දූෂිත ක්‍රියාවක් ලෙස සලකමි. එවැනි පටු ආත්මාර්ථකාමී අභිප්‍රායන් වෙනුවෙන්, මම කිසිදු යාඥා නොකරමි.'' පාඨකයෙනි මිතුරනි, එය අහංකාර බවක්ද? එය එසේ නම්, මම එය සඳහා නැගී සිටිමි.''

<u>*MRL*</u> ප්‍රකාශනයකි.

Blog: http://liberationbase.wordpress.com/
E-mail: slradical@ymail.com